**Sannasa**
244 Princes Hwy
Hallam Vic 3803 Australia

**Web: www.sannasa.net**
**www.sannasa.com**
email :sannasanews@gmail.com
Tel/Fax :03 9796 4241**after 4pm**

**සංස්කරණය / Editor**
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සංස්කරණ උපදේශක / Editorial Advisor**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සහය සංස්කාරක / Asst. Editor**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා / Graphics**
ශානලී එදිරිසිංහ Shanalee Edirisinghe

**වෙළඳ දැන්වීම් / Advertising**

**S Jayasinghe**
03 8707 4604
0402 025 516

**Anura Kulasekara**
0431 112 923

**email** ads.sannasa@gmail.com

**Account Details for Payments**

**Bank -** ANZ
**Branch -** 013312
**A/C number -** 254306608
**Name of A/C**
Sannasa News Group

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ශ්‍රියාණි මද්දුමගේ
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සේයා රූ / Photography**
Prasanna Kurukularatna

**සම්බන්ධීකරණය**

**NSW**
Lakshman Kodituwakku

**QLD**
Ananada Samaratunga
2, Santorini Pl.
Forest Lake
QLD 4078
(07) 3372 7958

**WA**
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhdist Vihara

**ACT**
Asoka Nimalasiri
0400 429 031

**SA**
Chandra Eeriyagama
08 8331 2318


පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත




## ව්‍යවස්ථාපිත ඒකාධිපතිත්වයක් කරා

යුද ජයග්‍රහණයෙන් පසු ශ්‍රී ලංකාව ඉතා යහපත් රාජ්‍යයක් බවට පත් කිරීමේ සුවිසල් ඉඩකඩක් මහින්ද රාජපක්ෂ රජය ඉදිරියේ විවෘතව තිබුණි. ඒ අවස්ථාව ප්‍රයෝජනයට ගනිමින් යහපත් රටක් ගොඩනැගීමේ දැක්මක් රජයට නොතිබුණ බව පැහැදිළිය. ඒ වෙනුවට තමන්ගේ බලය තහවුරු කරගන්නා වැඩ සටහන් කෙරෙහි යොමුවීමට රාජපක්ෂ රජය තීරණය කර තිබුණි මෙය රටක් ලෙස ශ්‍රී ලංකාව ලත් මහා පරාජයකි.

මර්වින් සිල්වා, දුමින්ද සිල්වා, ශිරාණි බණ්ඩාරනායක වැනි අය සම්බන්ධ සිදුවීම් වලදී රජය පෙන්නුම් කළ අදූරදර්ශීභාවය මුලු ලොව පුරාම රටේ හොඳ නම කැත කරන්නට සමත් විය. එපණක්ද නොවේ. මේ සිදුවීම් හරහා එතෙක් තමන් ඇඳ සිටි යුක්තියේ හා සාධාරණත්වයේ දුහුල් රෙදි පිළි පවා ගලවා දමා එළි පිටම නිරුවතින් දුවන්නට රජය පෙළඹී තිබෙන බවද දැන් ඇස් පනාපිට පැහැදිළිව පෙනෙයි.

මේ සියල්ල සිදුකරන්නේ මහජනතාව ඉදිරියේ ය. මේ කිසිවක් පිළිබඳව කතා කරන්නට පවා කිසිවකු නැතිසේ ය. මේ රජය ඉවත් කර පත්කරගන්නට තරම් සුදුසු ක්‍රියාකාරීත්වයක් පෙන්වන විපක්ෂයක්ද පෙනෙන තෙක්මානයක නැත. මීළඟ මැතිවරණයකදීත් මේ දූෂිතයන්ම පත්වීම නොවැළැක්විය හැකි දෙයකි.

එසේ නොවන්නට නම් ඒ වෙනුවෙන් මහජනයා තුළ දැනුම්වත්භාවයක් ඇති කළ යුතු ය. ඒ සඳහා සුදුසු ගාමක බලවේගයක් රට තුළ තිබිය යුතු ය.

**"වරද ඇත්තේ පාලකයන් ගේ නොව ඔවුන් පත් කරගන්නා මහජනතාවගේ ය. එබැවින් අප කළ යුත්තේ පාලකයන් වෙනස් කිරීම නොව අලුත් ජනතාවක් පත්කර ගැනීමය"** යන බර්ටෝල් බ්‍රෙෂ්ට් ගේ කියමන අදට හොඳින්ම ගැලපේ යයි අපට සිතෙයි.

## වැදගත් පියවරක්

ශ්‍රී ලංකාවේ දරුවන් විශ්ව විද්‍යාලයට යන වයස අඩු කිරීඹ සඳහා පියවර ගැනීමට රජය තීරණය කර ඇති බවක් පසුගිය දා උසස් අධ්‍යාපන ඇමති එස් බී දිසානායක මහතා ප්‍රකාශ කර තිබුණි. මෙය ඉතා කාලෝචිත යෝජනාවක් යයි අපි ද සිතමු. සාපේක්ෂ වශයෙන් ශ්‍රී ලංකාවේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් උපාධි ලබන වයස ඉතා වැඩි ය.

මේ වෙනුවෙන් ගත හැකි පියවර පිළිබඳව රජය සොයා බලාගෙන යන බවත් 7-8-9-10 පන්ති වලින් එකක් අඩු කළ හැකිද යන්න සොයා බැලෙන බවත් ප්‍රකාශ විය. විෂය ප්‍රමිතීන්ට හානි නොවන ආකාරයටත් සිසු මනසට වැඩි බරක් නොපැවරෙන ආකාරයටත් මේ කටයුත්ත කරන්නට රජය පියවර ගත යුතු ය.

අධ්‍යාපනයේ ප්‍රමිතිය බාල කිරීමකින් තොරව මේ අභියෝගය ජය ගන්නට රජයට හැකි නම් එය වැදගත් පියවරක් වනු ඇති බව නිසැක ය.

සංස්කාරක



# ආගමික අන්තවාදය රාජ්‍ය ව්‍යාපෘතියකි

ගාමිණී වියන්ගොඩ

යුද්ධය තුළ මේ රටේ මුස්ලිම් ජාතිකයන් සිටියේ දෙමළාගෙන් රට බේරා ගැනීමේ සිංහල ව්‍යාපෘතිය තුළය. එහි දී සිංහලයා විසින් දෙමළාට එරෙහිව ගොඩනගන ලද සකල ප්‍රබන්ධ මුසල්මානුවා ද පාවිච්චි කෙළේය. එදා ත්‍රස්තවාදයට විරුද්ධව පෙළගැසුණු පොදු මතවාදයක් ඇත්තෙන්ම තිබුණි. රටේ සාමාන්‍යන ජනතාව සිටියේ ඒ අසහනකාරී තත්ත්වයෙන් මිදීමේ මගක් සොයමිනි. එය ත්‍රස්තවාදය ඉවරයක් කර දැමීම නැමති අවසාන විසඳුම තුළ ඇතැ යි ඔවුහු විශ්වාස කළහ. පොදු ජනයා තුළ පැවති ඒ නියාලු අපේක්ෂාව, පාලකයාගේ බල ව්‍යාපෘතිය සූක්ෂම ආකාරයෙන් පෙළගස්වා ගැනීම සඳහා පාවිච්චි කිරීමේ දේශපාලනයක් සඳහා පාවිච්චියට ගැනෙමින් තිබුණු බව සාමාන්‍යයෙන් මේ රටේ පොදු ජනයාටත් විශේෂයෙන් සුළුජාතීන්ට හෝ අන්‍යාගමිකයන්ටත් එදා වැටහුනේ නැත. අද පැමිණ ඇත්තේ ඔවුන්ගේ හෝරාවයි. එක පැත්තකින් ඉස්ලාම් බැතිමතා ය. අනිත් පැත්තෙන් කිතුණු බැතිමතා ය.

මේ මොහොතේ රටේ පැන නැගෙමින් තිබෙන ආගමික ආතතිය කළමනාකරණය කර ගැනීම සඳහා තමන්ට සහාය වන්නැ යි ඊයේ ආණ්ඩුව විරුද්ධ පක්ෂයෙන් ඉල්ලා සිටි බව මාධ්‍ය වාර්තා කරයි. මේ කතා කරන්නේ ආගමික ආතතියක් ගැන ද, එසේ නැත්නම් ආගමික අන්තවාදයක් ගැන ද

යුද්ධයේ ජයග්‍රහණයේ හයියෙන් ගොඩනැගුණු ආගමික සහ ජාතික ආතතියක් ඇත්තෙන්ම රටේ තිබේ. මේ සා දුෂ්කර කාලයක් ගෙවා, මහත් වූ කැපවීමකින් අත්කරගත් යුදමය ජයග්‍රහණයේ පූර්ණ දේශපාලනික ප්‍රතිලාභ පාලකයා අත්කර ගන්නා විට, එහි අවශේෂ සමාජ ප්‍රතිලාභ සිංහල බෞද්ධයාට හිමිවිය යුතු බව, රටේ නායකයාගේ සිට වර්තමාන සමාජයේ පහළම ස්ථර දක්වා ගලා එමින් ඇති නිල නොවන දෘෂ්ටියයි. මෙය තමන්ට තරගයකින් තොරව අත්විය යුතු ව්‍යාපාරික ආයෝජනයක් වශයෙන් සිංහල බෞද්ධ වෙළෙන්දාගේ ගිණුම්පොතේ ලියැවෙයි. එසේ වූ කල නෝ ලිමිට් මුස්ලිම් සාප්පුවේ නොමිලේ බෙදාහැරෙන ටොෆියකිනුත් තවත් මුස්ලිම් ව්‍යාපාරිකයෙකු විකුණන යට ඇඳුම්වල තවරා ඇතැ යි කියන යම් රසායනිකයකිනුත් සිංහල පිරිමින්ව වඳ භාවයට පත්කෙරෙන බව අපට දැනුම් දෙනු ලැබේ. එසේ ඇති කෙරෙන සමාජ ආතතිය, ජාතික හෙළ උරුමය වැනි ආන්තික පතුරු සහ නවතමයෙන් ගොඩනැගෙන බොදුබල සේනා වැනි උමතු අන්තවාදී පිරිස්වල වේදිකාව බවට පත්වෙයි. මෙය එක ප්‍රශ්නයක කොටස් දෙකකි. ඒ සඳහා වන විසඳුම එකකි. එහෙත් අදියර දෙකකි.

උදාහරණයකින් එය මෙසේ පැහැදිළි කරගමු.

4 වන පිටට